## 8 පරිච්ඡේදය

# භික්ෂූන්ගේ අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති

පොළොන්නරු, දඹදෙණි කතිකාවත්වලින් හෙළිවන තොරතුරු අනුව ඒ කතිකාවත් පිහිටුවනු ලද කාලය වනවිට ඇතැම් භික්ෂූන් බොහෝ දුරට මහණදම් අතපසු කර අප්‍රතිපත්ති, දුෂ්ප්‍රතිපත්තිවල නියැලී සිටි බව හෙළි වෙයි. කතිකාවත් ව්‍යවස්ථාවලින් සමහරක් දුෂ්ප්‍රතිපත්තිවලින් වැළකී සිටිය යුතු බව නිර්දිෂ්ට කරන අතර තවත් ඒවා අනුගමනය කළ යුතු උසස් ගුණධර්ම සහ වත්පිළිවෙත් ආදිය සම්බන්ධයෙන් පැනවූ ඒවා ය. ඒ කාලවල භික්ෂූන් කුමන දුෂ්ප්‍රතිපත්තිවල ඇලී ගැලී සිටියේ ද කුමන ගුණධර්මවලින් පිරිහී සිටියේ ද යන කරුණු ඒ දෙයාකාරයේ ම ව්‍යවස්ථාවලින් තරමක් දුරට අනාවරණය කර ගත හැකිවනු ඇත. සංවරයෙන් අඩුවීම, වත්පිළිවෙත් ගරුකොට නොසැලකීම, වංචනික ක්‍රියාවලින් සිවුපසය සෙවීම, සැකසවුයුතු හැසිරීම් ඇතිව සිටීම, උදාර ගුණධර්මවලින් පිරිහීම යන මේවා එලෙස හෙළිවන දුර්වලකම් හැටියට පෙන්විය හැකි ය.

'**ඉධේකච්චෝ සංඝ ගතෝපි අචිත්තීකාරකතෝ ථේරේ භික්ඛූ ඝට්ටයන්තෝපි තිට්ඨති ඝට්ටයන්තෝපි නිසීදති ඨිතකෝපි භණති බාහාවික්ඛේපකෝපි භණති කුමාරකස්සපි සීසං පරාමසති**' යි අනාචාර නිර්දේශයෙහි වදාළ බැවින් සඟ මැදට එළඹියනු විසිනුදු පෙරෙවි සිවුරෙන් එවි නොහැඳිය යුතු, මහලු සඟුන් හා ඔබ්බවමිනා කරුණෙක් ඇත ආදර දක්වා ඉතා නොළංවූ තැන් සිටු අත් නොවනා හිඳිය යුතු' යන ව්‍යවස්ථාව කතිකාවත් දෙකේ ම දක්නට ලැබේ.[1] මෙයින් හෙළි වන එක් කරුණක් නම් නවක භික්ෂූන් වැඩිමහලු භික්ෂූන් ඉදිරියේ හැසිරිය යුතු අන්දම නොදැන සිටි බවයි. සඟ මැදට එළඹුණු අවස්ථාවල වැඩිමහලු භික්ෂූන්ට ගරුසරු නො දක්වා ඔවුනොවුන් හා ගැටෙමින් සිටි බවත්, කථාකිරීමට උචිතනා වූ විට හිස පාත්කොට ගරුසරු බවත් නො දක්වා ප්‍රමාණයට වඩා ගැවී, අත් එහා මෙහා විසි කරමින් කථා කළ බවත් එම ව්‍යවස්ථාවෙන් හෙළි වේ. මාහිමියන් වහන්සේ ධර්මවිනයානුකූල උපදෙස් දෙනවිට ඇතැම් භික්ෂූන් උන්වහන්සේගේ වචන වැකී යන අන්දමින් මැදට පැන (ඉස්මවා) කථා කළ බව දඹදෙණි කතිකාවතේ සඳහන් වෙයි.[2] මෙය නවක භික්ෂූන් අතින් ම සිදු වූ වරදක් හැටියට පෙන්වා නැත. මෙවැනි අඩුපාඩු බුද්ධ කාලයේ සිටි භික්ෂූන් අතරත් පැවති බව 'ආචාර්යයි උපාධ්‍යායන් වහන්සේලා කථා කරමින් සිටිය දී අතරතුර කතා නො බැඳිය යුතු ය' යනුවෙන් මහාවග්ගයෙහි දක්වා ඇති ප්‍රඥප්තියෙන් පෙනේ.[3]

---

1. දඹ. 161,-162 පිටු
2. දඹ. 163 පි.
3. මව 45, 61 පිටු.